41

Article 12(1)

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date: 2018-03-27

පැමිණිලි පාර්ශවය : ජී.ආර්.ඩී.එස්. ගම්ලත් මයා.
අංක 18/ජී. 25 වන පටුමග.
කොළඹ 03.

වගඋත්තරකාර පාර්ශවය : 1. විදුහල්පති.
රාජකීය විද්‍යාලය.
කොළඹ 07.

2. අධ්‍යක්ෂ (ජාතික පාසැල්)
අධ්‍යාපන අමාත්‍යංශය.
ඉසුරුපාය.
බත්තරමුල්ල.

පැමිණිලි අංකය : **HRC/2868/17**

පැමිණිල්ලේ කරුණු :-

2017-09-12 වන දිනැතිව උක්ත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් ප්‍රකාශ කර ඇත්තේ, තම කණිටු පුත්‍රයා වන සවෙන් සනුලක ගම්ලත් දරුවා 2018 වසරේ පළමු ශ්‍රේණිය සඳහා කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා 22/2017 චක්‍ර ලේඛය පරිදි සහෝදර පදනම යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කළ බවත්, තමාගේ වැඩිමහල් පුත්‍රයාද කොළඹ රාජකීය විද්‍යාලයේ 10 වන ශ්‍රේණියේ මේ වන විට ඉගෙනුම ලබමින් සිටින බවත් ය. අයදුම්පත් ඉදිරිපත් කරන අවස්ථාවේ භාර ගන්නා අවසන් දිනය 2017-06-30 ලෙස සඳහන්ව තිබූ බවත්, පසුව එම දිනය 2017-07-10 ලෙස සංශෝධනය වූ බවත්, ඒ අනුව තම පුත්‍රයා රාජකීය විද්‍යාලයට ඇතුලත් කර ගැනීම සඳහා චක්‍රලේඛයේ 3.3 යටතේ



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R. A. De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11-2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

දැනටමත් අදාල පාසලේ අධ්‍යාපනය ලබන සිසු සිසුවියන්ගේ සහෝදර සහෝදරියන් යන ගණය යටතේ අයදුම්පතක් 2017-07-10 වන දිනට පෙර විදුහල්පතිවරයා වෙත ඉදිරිපත් කරන ලද බවත් සඳහන් කර ඇත.

එම අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමෙන් පසුව 22/2017 චක්‍ර ලේඛයේ සංශෝධනයට ලක් වූ බවත්. එකී සංශෝධනයේදී ඉහත චක්‍ර ලේඛයේ 7.1.3 වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කර තිබූ බවත්. තමා අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ලද ගණය යටතේ ඉහත චක්‍ර ලේඛයේ 7.4 අනුව තමාට මුළු ලකුණු 53ක් ලබා ගැනීමට හැකිව තිබූ බවත්. සඳහන් කර ඇත. ඉහත චක්‍රලේඛයේ 7.1.3 වගන්තිය මගින් අවධාරණය කර තිබුණේ " මෙම ගණ සඳහා ලකුණු ක්‍රමයකට අනුව ලකුණු ලබා දෙන හෙයින්. ලකුණු දීමේ පටිපාටියේ එක් කොටසකට ලකුණු ලබා නොගත්තද ලකුණු හිමිවන අනිකුත් කොටස් සඳහා ලකුණු ලබාදිය යුතු අතර. එවැනි අවස්ථා වල එම ගණය සඳහා සම්පූර්ණයේනම ලකුණු ලබා දීම ප්‍රතික්ෂේප නොකළ යුතුය." යනුවෙන් වන බව දක්වා ඇත. කෙසේ වෙතත් තමා විසින් ඉදිරිපත් කරන ලද අයදුම් පතට අනුව S- 18-4018 යටතේ 2017-07-23 වන දින තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීමක් ලැබීමෙන් අනතුරුව ඒ සඳහා ඉදිරිපත් වූ බවත්. එහිදී තමාගේ අයදුම්පත සඳහා ලකුණු හිමි නොවන බවත්. අයදුම්පත ප්‍රතික්ෂේප කිරීමට කටයුතු කරන බවත් රාජකීය විදුහලේ විදුහල්පතිවරයා විසින් තමා වෙත ප්‍රකාශ කරන ලද බවද දක්වා ඇත . එහිදී තමා විසින් ඉහත චක්‍රලේඛයට අනුව තමාට ලකුණු 53ක් හිමිවිය යුතු බවට කරුණු ගෙනහැර දැක් වූ අවස්ථාවේදී. 22/2017 චක්‍ර ලේඛයේ 7.1.3 උප වගන්තිය සම්පූර්ණයෙන් ඉවත් කිරීම හේතුවෙන් පදිංචි ස්ථානයේ හිමිකම තහවුරු කරන ලේඛන නොමැති නම් සම්පූර්ණයෙන්ම අයදුම් පත ප්‍රතික්ෂේප කළ යුතු බව එහි දක්වා ඇති බවත්. ඒ අනුව තම අයදුම්පත්‍රය සඳහා ලකුණු ලබා දීමට හැකියාවක් නොමැති බවත් විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කරන ලද බවද සඳහන් කර ඇත.

පසුව මේ සම්බන්ධයෙන් තමා විසින් අභියාචනා හා විරෝධතා මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ නමුත් එහිදීද තමාට සාධාරණයක් ඉටු නොවූ බවට සඳහන් කර ඇත. මේ අනුව අයදුම් පත් භාර ගැනීමේ දිනය අවසන් වූ පසුව තමා විසින් ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයට අදාළව ගණයේ නිර්නායකයන් 2017-07-31 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සංශෝධනය නොකලේ නම් තම දරුවා රාජකීය විද්‍යාලයට ඇතුලත් කර ගැනීමට බාධාවක් නොවන බවත්. ඒ අනුව සංශෝධනය ඊට පෙර ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍ර සම්බන්ධයෙන් බලපෑමක් ඇති කිරීම මගින් තමාට මෙම අගතිය සිදු වී ඇති බවත්. යම් හෙයකින් තම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ දිනට පෙර මෙම සංශෝධනය ඉදිරිපත් වී තිබුණිනම් තමාට ඊට සුදුසු පරිදි අයදුම්පත්‍රය ඉදිරිපත් කිරීමට හැකියාවක් තිබූ බවත්. ඉහත සඳහන් ලිපියෙහි තමා පදිංචිව සිටින්නේ තම වැඩිමහල් පුත්‍රයා කොළඹ රාජකීය විද්‍යාලයේ ඉගෙනුම ලබමින් ක්‍රීඩා කටයුතු වලට ද සම්බන්ධ වන බැවින්.

සහ තම දියණියද කොළඹ විශාඛා විද්‍යාලයේ ඉගෙනුම ලබමින් සිටින බැවින් ඔවුන්ගේ පහසුව පිණිස බවත් දක්වා ඇත. එසේම තමා රාජකාරිය කරනු ලබන ශ්‍රී ලංකා නාවික හමුදාවේ චැටුප් සංග්‍රහයට අනුව පදිංචි ස්ථානය සඳහා රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ගෙවල් කුලී දීමනාවක් ලබා දෙන බැවින්. තමාගේ බිරිඳගේ ජාතික හැඳුම්පතහි පදිංචි ස්ථානය ලෙස ඉහත ලිපිනය සඳහන්ව ඇති බවත්. ඒ අනුව තමා සහ පවුලේ අය ඉහත ලිපිනයෙහි පදිංචි බවට සනාථ කර ඇති බවත්. තමා හට සින්නක්කර ඔප්පුවක් මගින් හිමිකමක් ඇති නිවසක් බොරලැස්ගමුව ප්‍රදේශයේ තිබෙන බවත්. අයදුම්පත ඉදිරිපත් කරන ලද අවස්ථාවේ 2017-07-31 දිනැති සංශෝධනය චක්‍ර ලේඛයේ සිදුව තිබුණිනම්. බොරලැස්ගමුව ලිපිනයෙන් තම අයදුම්පත ඉදිරිපත් කිරීමට හැකියාව තිබූ බවත්. එසේ සලකා බලන විටද සහෝදර පදනම යටතේ ලකුණු 49ක ප්‍රමාණයක් ලබා ගැනීමට හැකියාව තිබූ බවත් සඳහන් කර ඇත.

එසේම පසුගිය වසර කිහිපයේම සහෝදර පදනම යටතේ රාජකීය විදුහලේ පළමු වසර සඳහා දරුවන් ඇතුලත් කර ගැනීමේ අවම ලකුණු මට්ටම 20ට අඩුව පැවැති බවත්. එබැවින් තම දරුවා මෙම තත්ත්වය යටතේ ඇතුළත් කර ගැනීමට හැකියාව පැවැති බවත්. ඉහත සියලු කරුණු සැලකිල්ලට ගැනීමේදී අයදුම්පත් කැඳවා අවසන් වූ පසු තෝරා ගැනීමේ නිර්නායකයන් සංශෝධනය කිරීම මගින් තම දරුවා රාජකීය විද්‍යාලයේ පළමු වසරට ඇතුළත් කර ගැනීමට තිබූ අවස්ථාව අහිමි කර ඇති බවත්. තවද තමා මෙන්ම මේ ආකාරයෙන් අගතියට පත්ව තිබෙන අයදුම්කරුවන්ගේ දුක්ගැනවිලි සැලකිල්ලට ගෙන අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් විසින් සියලුම විදුහල්පතිවරුන් වෙත 2017-10-19 වන දින නිකුත් කර ඇති උපදෙස් මාලාවද නොසලකා හරමින් මෙහිදී රාජකීය විදුහල් පරිපාලනය කටයුතු කර ඇති බව පැමිණිලිකරු වැඩිදුරටත් සඳහන් කර ඇත.

ඒ අනුව මේ සම්බන්ධව කඩිනමින් විමර්ශනයක් සිදු කර තම දරුවා කොළඹ රාජකීය විදුහලේ 2018 වසරේ පළමු ශ්‍රේණියට ඇතුලත් කර ගැනීම සඳහා අවස්ථාව සලසා දෙන මෙන් ඉල්ලා සිට ඇත.

වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම :-

උක්ත පැමිණිල්ල මගින් පැමිණිලි පාර්ශවය ඉදිරිපත් කරන ලද චෝදනා මගින් ලිඛිත හා වාචික කරුණු දැක්වීම මගින් පළමු වගඋත්තරකරු වන විදුහල්පති. කොළඹ රාජකීය විද්‍යාලය ප්‍රකාශ කර ඇත්තේ. පැමිණිලිකරු තම පුත්‍රයා රාජකීය විද්‍යාලයට ඇතුළත් කර ගැනීම සඳහා අයදුම් පත්‍රය යොමු කර ඇත්තේ. 2017-06-25 දින බවත්. එහි අයදුම්පතට අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයට අනුව පදංචි තහවුරු කිරීම පිණිස එම නිවසට අදාළ කුලී ගිවිසුම අයදුම්පත සමග

යොමු කර ඇති බවත්ය. එම කුලී ගිවිසුම ප්‍රතික්ෂේප කිරීම මගින් අතිකුත් කාණ්ඩ වලට ලකුණු ලබා නොදීම නිවැරදි නොවන බවත්. ඒ අනුව අයදුම් පත සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම සාධාරණ නොවන බවත්. එමගින් නීතිය ඉදිරියේ සම අවස්ථාවක් තමාට නොලැබුණු බවට පැමිණිලිකරු ප්‍රකාශ කර ඇතත්. 22/2017 චක්‍ර ලේඛයට අනුව එය ඊට පෙර පැවති 17/2016 චක්‍ර ලේඛය අභිබවා බලපැවැත්වෙන බවත්. එමගින් 17/2016 චක්‍ර ලේඛය මගින් පිලිගත් ලේඛණයක් ලෙස එතෙක් සැලකූ ලියාපදිංචි නොකල බදු ගිවිසුම් 22/2017 චක්‍ර ලේඛය තවදුරටත් පිලිනොගැනීමේ තත්ත්වයක් පෙන්නුම් කරන බවත් සඳහන් කර ඇත. ඒ අනුව පැමිණිලිකරු සම්මුඛ පරීක්ෂණය සඳහා ඉදිරිපත් කර තිබූ කුලී ගිවිසුම ලියාපදිංචි නොකල එකක් බැවින්. එම ලේඛනයේ සඳහන් කුලී නිවස හිමියාගේ අයිතිය තහවුරු කිරීම පිණිස ඒ සමග කිසිදු ලේඛනයක් ඉදිරිපත් කර නොමැති බවත්. ඒ මත අදාල කුලී ගිවිසුමේ වලංගුභාවය හෝ සත්‍යතාවය නිර්නය කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට හැකියාවක් නොවූ බවත් සඳහන් කර ඇත.

තවද චක්‍ර ලේඛයේ 4.7 මගින් පාසලට දරුවන් ඇතුලත් කිරීමේ මූලික කොන්දේසිය ප්‍රකාශිතව සඳහන් කර ඇති අතර. ඒ අනුව පාසලට අයදුම්කරන දෙමාපියන් පාසල අයත් පෝෂිත ප්‍රදේශය තුල සිටිය යුතු අතර. එකී මූලික හරය බිඳහෙලන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම හෝ නොසලකා හැරීමට පරීක්ෂණ මණ්ඩලයට හැකියාව ඇති බව ප්‍රකාශ කර ඇත. ඒ අනුව පැමිණිලිකරු විශ්වාසය තබන 7.1.3 උප වගන්තිය ඉහත මූලික කොන්දේසියට යටත්ව සලකා බැලිය යුතු බවත්. ඒ අනුව ඔහු ඉදිරිපත් කරන පරිදි පදිංචිය තහවුරු නොවන අවස්ථාවකදි ඊට අදාල ලකුණු පමණක් ලබා නොදී ඉතිරි කොටස් වලට ලකුණු ලබා දීමට හැකියාවක් ඇති බවක්. 4.7 අනුව අදහස් නොකරෙන බවත් දක්වා ඇත. ඒ අනුව 22/2017 චක්‍ර ලේඛයේ 4.7 වගන්තිය අනුව පදිංචිය නම් වූ මූලික කරුණු තෘප්ත කල පසු වෙනත් කොටසක් යටතේ ලකුණු නොලැබුවද ඉතිරි කොටස් සඳහා ලකුණු ලබා දිය යුතු බව සඳහන් කර ඇත. ඒ අනුව ඉවත් කර ඇති 7.1.3 උප වගන්තිය අනුව පැමිණිකරුට සහයක් නොවන බවට විදුහල්පතිවරයා වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත. ඉහත කරුණු මත පදිංචි ස්ථානය පිලිබඳ තහවුරු කිරීමට අපොහොසත් වීම මත පැමිණිලිකරුගේ ඉල්ලුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සත්භාවයෙන් කටයුතු කර ඇති බවද සඳහන් කර ඇත.

මීට අමතරව විදුහල්පතිවරයා විසින් තවදුරටත් පෙන්වා දෙන පරිදි අදාල කුලී ගිවිසුම 2016-02-25 වන දින අත්සන් කර ඇති අතර. ඒ අනුව අයදුම්කරු එදින සිට එහි පදිංචිව සිටින බවක් නිරීක්ෂණය වන බවද නමුත් ඊට පෙර ඉදිරිපත් කර ඇති පැමිණිලිකරුගේ භාර්යාවගේ ජාතික හැඳුනුම්පත් සහ දරුවාගේ උප්පැන්න සහතිකයේ එකී ලිපිනය සඳහන්ව තිබීම ගැටලුවකි. තවද ශ්‍රී ලංකා නාවික හමුදාවේ නිකුත් කල බවට දක්වා ඇති 2017/6/22 දිනැති ලිපියෙද ලබාදී ඇති ග්‍රාම නිලධාරි සහතිකයේද සඳහන්ව ඇත්තේ පැමිණිලිකරු 2012 වසරේ සිට ඉහල

ලිපිනයෙහි පදංචි වී සිටින බවයි. ඒ අනුව තවදුරටත් පැමිණිලිකරුගේ පදිංචිය සම්බන්ධව ගැටලු මතුවන බව වගඋත්තරකරුවන් දක්වා ඇත. ඒ අනුව පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් කඩවන ආකාරයෙන් විදුහල්පති රාජකීය විද්‍යාලය ඇතුලු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය හෝ අභියාචනා හා විරෝධතා මණ්ඩලය ක්‍රියා කර නොමැති බව සඳහන් කර ඇත.

අධ්‍යාපන අමාත්‍යාංශයේ කරුණු සැලකිරීම් :-

මෙම පැමිණිල්ල සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශනයේදී ලේකම්. අධ්‍යාපන අමාත්‍යාංශය වෙනුවෙන් සහකාර අධ්‍යක්ෂ නීතිඥ පී.ජේ.ඩී.පී.තිශාන්ත මහතා ප්‍රකාශ කර ඇත්තේ. මෙම ප්‍රශ්නගත කාරණයේදී රාජකීය විදුහල්පතිවරයා ඇතුලු සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය අභියාචනා හා විරෝධතා මණ්ඩල සාමාජිකයන් 22/2017 චක්‍ර ලේඛය පරිදි කටයුතු කර ඇති බවත්. ඒ අනුව පැමිණිලිකරුට මෙහිදී අගතියක් සිදු ව ඇති බවට අධ්‍යාපන අමාත්‍යාංශය පිලිනොගන්නා බවත්ය. තවද ඉහත චක්‍රලේඛය පරිදි කටයුතු කිරීමට අදාල පාසල් වල විදුහල්පතිවරුන්ට සහ අභියාචනා විරෝධතා මණ්ඩල සභාපතිවරුන් ඇතුලු සාමාජිකයින්ට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් බලතල ලබාදී ඇති බවද වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

විමර්ශනය :-

මෙම පැමිණිල්ලේ වැඩිදුර විමර්ශනයේදී පැමිණිලිකරු ඉල්ලා සිටින සහනය ලබා දී පැමිණිල්ල සමථයකට පැමිණීමට වගඋත්තරකරුවන් වෙත යෝජනා කර ඇතත්. ඔවුන් ඊට එකගතාවය පළ කර නැත. කෙසේ වෙතත් කොළඹ රාජකීය විදුහල වෙනුවෙන් මෙම පරීක්ෂණ සඳහා සහභාගී වී ඇති නියෝජයින් ප්‍රකාශ කර ඇත්තේ මානව හිමිකම් කොමිෂන් සභාව මේ සම්බන්ධයෙන් නිර්දේශයක් ලබා දෙන්නේ නම් පැමිණිලිකරුගේ පුත්‍රයා තම විදුහලේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට හැකියාවක් ලබා දිය හැකි බවයි.

නිරීක්ෂණ/ නිගමන යෝජනා –:

මෙම පැමිණිල්ලට අදාලව සිදු කර ඇති වැඩිදුර විමර්ශනයේදී අදාල පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කර ඇති ලිඛිත හා වාචික කරුණු සියල්ල සහ 22/2017 චක්‍ර ලේඛය මෙන්ම ඒ සම්බන්ධයෙන් 2017-07-31 දිනැතිව 22/2017 (I) ලෙස අධ්‍යාපන ලේකම්වරයා විසින් සිදු කර ඇති සංශෝධනය සහ ඒ සම්බන්ධයෙන්ම 2017-09-19 දිනැතිව සියලුම විදුහල්පතිවරුන් වෙත ලබා දී ඇති උපදෙස් සහිත ලිපිය සම්බන්ධයෙන් අවධානය යොමු කර ඇත. ඒ අනුව

පැමිණිලිකරු තම කණිටු පුත්‍රයා රාජකීය විද්‍යාලයේ 2018 පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීමට සහෝදර පදනම යටතේ අයදුම්පත්‍රයක් ඉදිරිපත් කර ඇත්තේ චක්‍ර ලේඛය සංශෝධනය වීමට ප්‍රථමව බව නිරීක්ෂණය වේ. ඒ අනුව චක්‍ර ලේඛය සංශෝධනය වීම මගින් ඉහතින් සඳහන් කර ඇති පරිදි ඊට පෙර පැවැති චක්‍ර ලේඛයේ සඳහන් වගන්ති සහ නිර්නායක මත ඉදිරිපත් කර ඇති අයදුම්පත්‍රය ප්‍රතික්ෂේප කිරීම කෙරෙහි මෙහිදි අවධානය යොමු විය යුතුය.

එසේම පැමිණිලිකරු තම පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති ලියාපදිංචි නොකළ බදු ගිවිසුම හැරුණු කොට තම පදිංචිය සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අනිකුත් සියලුම ලේඛන කෙරෙහි සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සහ අභියාචනා විරෝධතා මණ්ඩල සාමාජිකයින් සැලකිල්ලක් දක්වා නොමැති බව නිරීක්ෂණය වේ. ඒ අනුව ඒ සම්බන්ධයෙන් විශේෂයෙන්ම අදාළ වන 2017-09-19 දිනැති අධ්‍යාපන ලේකම්වරයා විසින් විද්‍යාලපතිවරුන් වෙත ලබා දී ඇති උපදෙස් සහිත ලිපිය කෙරෙහි අවධානය යොමු කරන විට එමගින් පැමිණිලිකරුට යුක්තිය ඉටුවීමට තිබූ අවස්ථාවක් වගඋත්තරකරුවන් විසින් නොසලකා හැර ඇති බවද වැඩිදුරටත් නිරීක්ෂණය වේ. ඒ අනුව පැමිණිල්ලේ වගඋත්තරකරුවන් විසින් ඔහු විසින් ඉදිරිපත් කර ඇති අයදුම් පත්‍රයට ලකුණු කිසිවක් ලබා නොදී සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කිරීම නීතියට අනුකූල නොවන බවට නිගමනය කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි.

මෙම තත්ත්වය මත පැමිණිලිකරු වෙත 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් සහතික කර දී ඇති නීතිය ක්‍රියාත්මක කිරීම සර්වසාධාරණ විය යුතු බවට වන මූලික අයිතිවාසිකම වගඋත්තරකරුවන් විසින් උල්ලංඝනය වන ආකාරයෙන් කටයුතු කර ඇති බවට මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

නිර්දේශය :-

> ඒ අනුව පැමිණිලිකරුගේ පුත්‍රයා වන සවෙන් සතුලක ගමලත් දරුවා 2018 වසරේ කොළඹ රාජකීය විද්‍යාලයේ පළමු ශ්‍රේණියට ඇතුළත් කර ගැනීම සඳහා වගඋත්තරකාර පාර්ශවය විසින් විසින් කටයුතු කළ යුතු බවට මෙයින් නිර්දේශ කරනු ලැබේ.

2018. 04. 27 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේ ම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර. එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොලබන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
B/ Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.

කොමසාරිස්.
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
Human Rights Commission of Sri Lanka
No. 14, R.A. De Mel Mawatha,
Colombo 04.